

## සරසවියට මිලිටරි පුහුණුව

ලියා දන්වන වග යි

ආණ්ඩුව කරවන බලවතුන්ගේ සිහිය හොඳටම විකල් වෙමින් තිබෙන හැඩයි. දවසින් දවසම කරමින් තිබෙන සහ කරන්නට යෝජනා කරමින් තිබෙන දේ දිහා බලන විට එහෙම නොහිතුණොත් පුදුමයකි.
මතට තිත තියනවායි කියමින් රූපවාහිනියේ ටෙලිනාට්‍යයකවත් මත් පැන් බොන දර්ශනයක් පෙන්වීම තහනම් කරද්දී බලවත්තු සතිපතා මුඩුවිතෙන් සන්තර්පනය වන මහා සාද පවත්වති. කාන්තාවන්ගේ කොට ඇඳුම් තහනම් කළ යුතු යයි එක් ඇමැත්තෙක් කියන විට සරසවි සිසුන්ට හමුදා පුහුණු ලබා දිය යුතු යයි තවත් ඇමැත්තෙක් යෝජනා කරයි.

අනෙක් යොජනා කොහොම වෙතත් සරසවි සිසුන්ට මිලිටරි පුහුණුව ලබා දීම නම් ඔවුන් ගැන අනුකම්පාවෙන් සිතා ගත් කාලෝචිත පියවරක් බෙව පෙනෙයි.

පහුගිය කාලය පුරා පොලීසියෙන් මේ අසරණයන් ගුටි කෑ හැටි දකින විට තුවක්කුවක් කොහොම වෙතත් අඩුම ගානේ පොලු කෑල්ලකින් වත් හටන් කරන හැටි මේ අසරණ සිසුන් දැන සිටීම යහපත් යයි පමා වී හෝ බලධාරීන්ට වැටහීම රටේ සුබ සිද්දියටම හේතු වනවා නොඅනුමාන ය. මින් මත්තට සරසවි කොලු ගැටයන්ට බැටන් පොලු උරුක් කරන් එන පොලීසියේ මහතුන් දෙවරක් කල්පනා කළ යුතු වෙයි. මිලිටරි පුහුණුව ලැබූ කොලු ගැටයන් ඒ වගේ වෙලාවට භාවණා කරමින් නොසිටිනු ඇතැයි සිතෙන බැවිනි.

සරසවි සිසුන්ට මිලිටරි පුහුණුව ලබා දීම පිළිබඳව කවුරුන් විරුද්ද වුණත් ජනතා විමුක්ති පෙරමුණ නම් කටක් හොල්ලා වචනයකින් හෝ විරුද්ධ නොවනු ඇත. මීළඟ වතාවේ කැරැල්ලට යන විට ඒ උදවියට රෙඩි මේඩ් හමුදාවක්ම ආණ්ඩුව ගානේ ම පුහුණු කර දී තිබීම ගැන විරුද්ධ වන්නේ මොන කෙංගෙඩියට ද?

බඩුමිල ඉහළ යාම, උතුරේ වැසියන් නැවත පදිංචි කර ඔවුන්ට යහපත් දිවි පෙවෙතක් ලබා දීම වැනි සිල්ලර වැඩ පසකෙ ලා සරසවි සිසුන්ට හමුදා පුහුණුව ලබා දීමට ආණ්ඩුව ගත් දූරදර්ශී තීන්දුවට සකල වි ධරට වැසියන් පටි තද කරගෙන සහය දිය යුතුම ය. මොකද අද රටේ තිබෙන දැවැන්තම ප්‍රශ්නය සරසව සිසුන්ට මිලිටරි පුහුණුවක් නැති එක ය.

ජයවේවා.. සුබ අනාගතයක්...

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .

සිය සිවියේ සැඳෑ සමය මෙල්බර්න් උප නගරයක නිහඬව ගත කොට 2008 අග දී මිය ගිය අපේ ලේඛකයකු වූ එච් පී සිරිවර්ධන ලියූ කෙටි කතා අතර -දේශපාලකයන් නැති ලෝකය" නමින් ද ලස්සන කතාවක් ඇත. ප්‍රකට වොලිබෝල් ක්‍රීඩක සිරිවර්ධනලා දෙදෙනාගෙන් පළමුවැන්නා වූ ඔහු ඒ කෙටි කතාව ලියුවේ ජීවිත කාලයක් තුළ ලද අත්දැකීම් ඇසුරෙනි. පරණ පාර්ලිමේන්තුවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ නිලධාරියකු වශයෙන් උත්තර මෙන්ම අනුත්තර මන්ත්‍රීන් හා ඇමතියන් පුද්ගලිකව දැන සිටි සිරිවර්ධනගේ දේශපාලන අරුචිය ඒ කතාවෙන් පිළිබිඹු විය. කෙසේ වුවමත් ඔහු සිය කෙටි කතාව ඔස්සේ දුටු සිහිනය කිදි දිනෙක සැබෑ වූයේ නැත. ඉදිරියට සැබෑ වන පාටක් ද නැත.



ඒ වාගේම අදහසක් මට පහළ වූයේ නොබෙ-ර්දා ජනාධිපති පදවි ප්‍රාප්ති උත්සව සමයේ දී ය. ඒ වන්දි භට්ටයන් නැති ලෝකයේ කොහොම වුණත් ශ්‍රී ලංකාවේ වත් දැකීමේ චේ.තනාව ය. එයට මුල් වූ සිද්ධිය ද කිව යුතු ය. මට මුළින්ම ඇති වූ අදහස ප්‍රශ්නයක් ලෙසින් මතු වූවකි.

"ශ්‍රී ලංකාවේ තවමත් කොණ්ඩය බැඳපු චීනුන් ඉන්නවා කියා අගමැති තුමා හිතනවාද?"

මෙය අකාරුණික සිතිවිල්ලක් - ප්‍රශ්නයක් - බව දනිමි. එහෙත් මගේ හිතට වැටුණේ ඇත්තටම ඔය ආක-ාරයටම ය. ඔය වචනම ය.

# වන්දිභට්ටයන් විරහිත ලෝකයක්?

<u>පළපුරුදු දේශපාලකයන්ටත් අමතක වන දෙයක් ඇත. ඒ දේශපාලකයන්ගේ ජනප්‍රියතාව සහ පිළිගැනීම අතීතයේ අඩුක්කර තබන්නට බැරි බව ය. බොහෝ විට ඡන්දදායකයා ලස්සන අතීතය අමතක කොට ඊට වඩා හොඳ අනාගතයක් සොයන බව ය.</u>

දෙවැනි පදවි ප්‍රාප්තිය වෙනුවෙන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට චිර ජීවිතය ප්‍රාර්ථනා කරන දැන්වීම-ක් පත්තර පිටුවක් පුරා - එය පළ වූයේ අග්‍රාමාත්‍ය දි මු ජයරත්න නමින් ය - ඒ වුණාට අග්‍රාමාත්‍ය කාර්යාලයේත් බුද්ධ ශාසන අමාත්‍යාංශයේත් නම් යටින් ඇත. ඒ කියන්නේ දැන්වීමට සල්ලි ගෙවන්නේ ඔය ආයතන දෙක ය. ආයතන දෙක කියන්නේ බදු ගෙවන ශ්‍රී ලාංකික ජනතාව ය. කජු ඇට ද කොස් ඇට ද?

නැත. මහජන මුදල් ය.

මට හිතෙන හැටියට ඔහොම දැන්වීමකට ලක්ෂ ගණන් මුදල් යන්නට ඇත. නවසිය අසූ ගණන් වල මැතිනියට ජය පතා පළ කරන ලද පිටුවක දැන්වීමකට මමත් සම්මාදම් වූයෙමි. මගේ වැටුපෙන් කාලක් පමණ මුදලක් - රුපියල් දාහක්.. ඒ කාලයේ පිටුවකට අය කළේ තිස් දහස් ගණනකි. අද හැටියට එය ලක්ෂ තිහක් වුවත් මම පුදුම නොවෙමි.

දි මු ජයරත්න මහතා තමා ලද තනතුර වෙනුවෙන් ජනාධිපතිට ණය ගැති බව නොදන්නේ කවුද? අවුරුදු ගණනාවක් පෙරුම් පුරා කිහිප වතාවක් කටින්ම .. හරි නොගිය ඒ තනතුර තමාට දීම ගැන අවංකව ම ණය ගැති විය යුතු ය. ඒ වතාවේත් කලින් හිටපු අගමැති පමණක් නොව තවත් ඇමතිවරුන් තුන් හතර දෙකනුම ඇස ගසාගෙන සිටි තනතුරකි ඔහුට ලැබුණේ. ඒ දීමනාව ගැන ජනාදිපති තුමාට පින් දී කැමති නම් දෙපා මුල වැද වැටී

4 වන පිටට

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**සේයා රූ / Photography**
ප්‍රසන්න කුරුකුලරත්න Prasanna Kurukularatna

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
email - ads.sannasa@gail.com

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318